රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
அரச கணக்குகள் திணைக்களம்
# Department of State Accounts


| මගේ අංකය / எனது இல. / My No. | SA/FR/Policy/Asset/01 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2024.02. 22 |
|---|---|---|---|---|---|

**රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක: 03/2024**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ

දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

**විදේශ අරමුදල් මගින් මූල්‍යයනය වන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රකාශනවල විනිමය අනුපාත වෙනස්කම් ගැලපීම**

විදේශ අරමුදල් ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන ඇතැම් ආයතන මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති වත්කම් සඳහා විනිමය අනුපාත වෙනස්කම් ගැලපීම සිදුකරන බව වාර්තා වී ඇත. එබැවින්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් විදේශ අරමුදල් සහිත ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රකාශන තුළ විදේශ විනිමය වෙනස්කම් ගැලපීම සිදුකිරීමේ අවශ්‍යතාව නිර්ණය කිරීම සම්බන්ධයෙන් පහත මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබේ.

1. විදේශ මුදල් මූල්‍ය අයිතමයන් අවසාන විනිමය අනුපාත භාවිතයෙන් පරිවර්තනය කළ යුතු අතර, ඓතිහාසික පිරිවැයට අගය කරනු ලබන මූල්‍ය නොවන අයිතමයන්ගේ විදේශ මුදල් වටිනාකම ගනුදෙනුව සිදු වූ දිනයේ විනිමය අනුපාතිකය භාවිතයෙන් පරිවර්තනය කළ යුතු ය. මූල්‍ය අයිතමයක අත්‍යවශ්‍ය අංගයක් වන්නේ, ස්ථිර හෝ තීරණය කරන ලද මූල්‍ය ඒකක සංඛ්‍යාවක් ලැබීමට ඇති හිමිකම හෝ බැඳීමයි. අනෙක් අතට මූල්‍යමය නොවන අයිතමයක අත්‍යවශ්‍ය අංගයක් වන්නේ, ස්ථිර හෝ තීරණය කරන ලද මූල්‍ය ඒකක සංඛ්‍යාවක් ලැබීමේ හිමිකමක් හෝ බැඳීමක් නොමැති වීමයි.

2. ව්‍යාපෘති සඳහා භාණ්ඩාගාරය විසින් සපයනු ලබන විදේශ ණය එම ව්‍යාපෘති විසින් ආපසු ගෙවීමට බැඳීමක් නොමැති බැවින්, ව්‍යාපෘති සඳහා සපයනු ලබන විදේශ ණය, වගකීමක් ලෙස ව්‍යාපෘති මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ඇතුළත් නොකළ යුතු ය.

3. රජයේ මූල්‍ය ප්‍රකාශනවල වගකීමක් ලෙස විදේශ ණය හඳුනාගනු ලබන බැවින් සෑම මූල්‍ය වර්ෂයකම දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරනු ලබන අවසාන විනිමය අනුපාත භාවිත කරමින් විනිමය වෙනස්කම් ගැලපීම සිදුකර ණය ශේෂයන් රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ පෙන්නුම් කරනු ලැබේ.


මහා භාණ්ඩාගාරය, කොළඹ 01, ශ්‍රී ලංකාව පොது திறைசேரி, கொழும்பு 01, இலங்கை. General Treasury, Colombo 01, Sri Lanka.
General-Tel.: +94 11 2484500/600 Ext.: 1149
Director General - Tel.: +94 11 2484728
Fax: +94 11 2484869
Fax: +94 11 2473856
Website: www.sad.gov.lk
e - mail: dgsa@sad.treasury.gov.lk

එබැවින්, ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රකාශන තුළ විනිමය වෙනස්කම් ගැලපීම අවශ්‍ය නොවේ.

ඩබ්.ඒ. සමන්ත උපනන්ද
අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

පිටපත්:

1. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය
2. අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
3. අධ්‍යක්ෂ ජනරාල්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව